# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 819 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/05/2024<br>පැය 0545 |

# මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - අතුරුගිරිය පොලිස් වසම.**

2024.05.15 වන දින රාත්‍රී කාලයේ පහරදීමකින් බවට සැකකෙරෙන පුද්ගලයෙකු අතුරුගිරිය රෝහලට ඇතුලත් කිරීමේදි මියගොස් ඇති බවට අතුරුගිරිය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ හොරහේන, හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අතුරුගිරිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඝාතනයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසය.**

2024.05.15 වන දින දහවල් කාලයේ වැලිකඩ පොලිස් වසමේ ඔබේසේකරපුර ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 11ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන වැලිකඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 42ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

වැලිකඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.05.15 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ඕබන් පෙදෙස හා හොටෙල්පාර හන්දියේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 300ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 38 හා 45 වයස් වල පසුවන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද සිගරට් තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය - ගුවන්තොටුපල ඒකකය.

2024.05.15 වන දින දහවල් කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත බැංගලෝර් සිට මෙරටට ගුවන් යානයකින් පැමිණි පුද්ගලයෙකු පරික්ෂා කර එම පුද්ගලයා සන්තකයේ තිබූ නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 21000 ක් (කාටුන් 105) ක් සමඟ අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඉගිණියාගල පොලිස් ස්ථානය.

2024.05.15 වන දින සවස් කාලයේ ඉගිණියාගල පොලිස් වසමේ අඹගහවැල්ල ප්‍රදේශයේදී ඉගිණියාගල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන අඹගහවැල්ල, අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉගිණියාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. නිවසක් ගිනි ගැනීමක් - යාපනය පොලිස් වසම.

2024.05.15 වන දින රාත්‍රී කාලයේ යාපනය පොලිස් වසමේ අංක 479, මනිප්පායි පාර ලිපිනයේ නිවසක් ගිනි ගන්නා බවට යාපනය පොලිස් ස්ථානයට ලද පණිවිඩක් මත වහා ක්‍රියාත්මක වූ නිලධාරීන් යාපනය ගිනි නිවීමේ ඒකකයේ සහය ඇතිව ගින්න නිවා දැමීමට කටයුතු කර ඇත.

ගින්න හටගන්නා ගන්නා අවස්ථාවේ නිවැසියන් නිවසේ සිට නොමැති අතර ගින්න හේතුවෙන් දේපල හානි පමණක් සිදුව ඇත. ගිනි ගැනීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කොටවෙහෙර පොලිස් වසම.

2024.05.15 වන දින අළුයම් කාලයේ කොටවෙහෙර පොලිස් වසමේ කුරුණෑගල පුත්තලම මාර්ගයේ වීරගොල්ල ප්‍රදේශයේදී, කුරුණෑගල දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ ලොරි රථයක මාර්ගය හරහා ගමන් කළ පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා නිකවැරටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය නිකවැරටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොටවෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - තිරප්පනේ පොලිස් වසම.

2024.05.15 වන දින රාත්‍රී කාලයේ තිරප්පනේ පොලිස් වසමේ ගල්කුලම මිහින්තලය මාර්ගයේ කිලෝමිටර් 123 කණුව ආසන්නයේදී ගල්කුලම දෙස සිට මිහින්තලය දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඊට ප්‍රති විරුද්ධ දෙසින් පැමිණි තවත් යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදි දෙකෙහි පැදිකරුවන් දෙදෙනා මිහින්තලය රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ කරුවලගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තිරප්පනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - සපුගස්කන්ද පොලිස් වසම.

2024.05.16 වන අද දින අළුයම් කාලයේ සපුගස්කන්ද පොලිස් වසමේ වීමෝල හන්දිය බටලන්ද මාර්ගයේ බටලන්ද ආරක්ෂක මාණ්ඩලික විද්‍යාලය අසලදී වීමෝල හන්දිය දෙස සිට බටලන්ද දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු හා මගියෙකු රාගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ත්‍රීරෝද රථ රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ ස්ට්‍රැෂ්පි වත්ත, අප්කොට් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**